සැ. යු.- 2020.11.20 දින අංක 2203 දරන ගැසට් පත්‍රයේ II, III, IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,204 - 2020 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2020.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1980 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1998 |

*සැ. යු.*-(i) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2020 නොවැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2020 නොවැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 දෙසැම්බර් මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1977 B 82081 — 5,403 (2020/11)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්වේච්ඡා නිලධාරීන් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට සුදුසු පිරිමි / කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
(ආ) වෛද්‍ය ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි / කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*මූලික අධ්‍යාපන සුදුසුකම් :*

අ. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටීම අනිවාර්ය වේ. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර)

ආ. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

ඇ. ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගත් (Pearson / Edexcel - International Ordinary / Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමග සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

*වෘත්තීය / ශාස්ත්‍රීය සුදුසුකම් :*

අ. ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව :

(1) සිවිල්/ කාර්මික / විදුලි ඉංජිනේරුවන් - පිරිමි (ස්වේච්ඡා)

සිවිල් / කාර්මික / විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ සිවිල් / කාර්මික / විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී) / ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්) / උසස් ජාතික ඩිප්ලෝමාව (එච්.එන්.ඩී.ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (3) පළපුරුද්දක් ලබා තිබීම.

(2) වාස්තු විද්‍යාඥ - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

Bsc (BE) උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක (1) පළපුරුද්දක් ලබා තිබීම හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද වාස්තු විද්‍යාව පිළිබඳ (B Arch) උපාධිය ලබා තිබීම.

(3) ප්‍රමාණ සමීක්ෂක නිලධාරීන් - පිරිමි (ස්වේච්ඡා)

මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද ප්‍රමාණ සමීක්ෂණ පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (3) වෘත්තීමය පළපුරුද්දක් ලබා තිබීම හෝ රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය (UNIVOTEC) මගින් පිරිනමන ලද ප්‍රමාණ සමීක්ෂක පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබීම.

ආ. වෛද්‍ය ශාඛාව :

(1) වෛද්‍ය නිලධාරීන් - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

වෛද්‍ය (එම්.බී.බී.එස්) උපාධිය හෝ ඒ හා සමාන විදේශ වෛද්‍ය විද්‍යාලයකින් සමත්වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි MBBS (ශ්‍රී ලංකා) උපාධියට සමාන සුදුසුකම් තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභා මණ්ඩලයේ (SLMC) ස්ථිර ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) පූර්ව සීමාවාසික වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

පූර්ව සීමාවාසික වෛද්‍ය උපාධිලාභීන් MBBS (ශ්‍රී ලංකා) උපාධිය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ විදේශ වෛද්‍ය විද්‍යාලයකින් සමත්වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි MBBS (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්යයෙන්ම ලබා තිබීම සහ වෛද්‍ය සභාවේ තාවකාලික (Provisional) ලියාපදිංචි වී තිබීම.

3. *අනෙකුත් සුදුසුකම් :*

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය |
| ආ. | සිවිල් තත්වය | :- විවාහක / අවිවාහක |
| ඇ. | ස්ත්‍රී පුරුෂ භාවය | :- පිරිමි / කාන්තා (අදාල පරිදි) |
| ඈ. | වයස | :- 2021 ජනවාරි මස 15 වන දිනට අවුරුදු 18 සිට 33 දක්වා |
| ඉ. | උස | :- පිරිමි - සෙන්ටිමීටර් 167.5 (අඩි 5 යි අඟල් 6) ක් හෝ ඊට වැඩි විය යුතුය<br>වෛද්‍ය ශාඛාව - සෙන්ටිමීටර් 165.0 (අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය<br><br>කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5 යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුය<br>වෛද්‍ය ශාඛාව - සෙන්ටිමීටර් 160.0 (අඩි 5 යි අඟල් 3) ක් හෝ ඊට වැඩි විය යුතුය |
| ඊ. | බර | :- පිරිමි $17 < \text{ශරීර ස්කන්ධ දර්ශකය} > 26$<br>කාන්තා $17 < \text{ශරීර ස්කන්ධ දර්ශකය} > 25$<br><br>$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස (මී)}^2}$ |
| උ. | පපුව | :- අඟල් 32" ට නොඅඩු විය යුතුයි (පිරිමි) |
| ඌ. | වර්ණ දෘෂ්ටිය | :- සීපී2 |
| එ. | දෘෂ්ටි තීක්ෂණත්වය | :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් / කාච රහිතව) (වෛද්‍ය ශාඛාවේ අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ටි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක්නම් එය උපැස් සහිතව 6/6 තත්වයට තිබීම අනිවාර්ය වේ). |

4. ***විශේෂ සටහන් :***

(1) ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිනුම් වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

(2) තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් / ෆ්ලයින් ඔෆිසර් / ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිළයන්හි අධිකාරියට පත් කරනු ලැබේ.

(3) තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් හට ලිඛිත, ප්‍රායෝගික පරීක්ෂණයකට සහ නිළධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා පෙනී සිටීමට සිදුවේ.

(4) තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(5) සියලුම උපාධින් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කළ යුතුය.

(6) යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් / දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු / ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(7) ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්ථමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(8) *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

(9) තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයකදී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේදී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිළධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්ථා කරනු ලැබුවහොත් එම නිළධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසි වලට අනුකූලව වෙන යම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

(10) 1951 අප්‍රේල් මස 27 වන දින අංක 10,240 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිළධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය / (ස්වේච්ඡා) අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව ''සෑම නිළධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක'' කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිළධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප / ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසි වලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

(11) ගුවන් හමුදා නිළධාරින් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ කවර තැනකට වුවද යවනු ලැබීමට යටත් වේ.

(12) විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිළධාරීන් පාලනය කරනු ලැබේ.

(13) අවිවාහක නිළධාරින්, නිළධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට /ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවයද සපයනු ලැබේ. අවිවාහක නිළධාරින්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(14) විවාහක නිළධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිළධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 5. ඇ. (11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

5. *වැටුප් හා දීමනා :*

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිළධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :-

| වසර / නිළය | 2021 (වාර්ෂිකව) රු. |
|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | 463,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | 502,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 571,380.00 - (30x16020) = 1,051,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 667,500.00 - (24x16020) = 1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 731,580.00 - (22x16020) = 1,084,020.00 |
| විංග් කමාන්ඩර් | 751,140.00 - (17x19560) = 1,083,660.00 |

(ආ) වෛද්‍ය නිළධාරීන්ගේ වැටුප් :

| වසර / ශ්‍රේණිය | 2021 (වාර්ෂිකව) රු. |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 651,480.00 (2x16020-7x16140-2x19560-16x26040) - 1,252,260.00 |
| 2 වන ශ්‍රේණිය | 699,660.00 (6x16140-2x19560-16x26040) - 1,252,260.00 |
| 1 වන ශ්‍රේණිය | 861,660.00 (15x26040) - 1,252,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 1,056,000.00 (12x32400) - 1,444,800.00 |

(ඇ) අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා :

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)
විශේෂ ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 2,125.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 400.00 (මසකට)

(3) විවේක කාල රාජකාරී බටා,
ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 35,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරී දීමනාව

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 687.00 (පැයකට)
2 වන ශ්‍රේණිය - රු. 796.00 (පැයකට)
1 වන ශ්‍රේණිය - රු. 1,101.00 (පැයකට)
විශේෂ ශ්‍රේණිය - රු. 1,302.00 (පැයකට)

(5) 5. ඇ. (18) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඈ) අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00 ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ.

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.

(7) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 774.37 පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දිමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට - රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිළය සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500.00 සිට රු. 5,000.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට /බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුල වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිළධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිළධාරින් සඳහා පමණයි)

(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි)

(21) අමතර රාජකාරී ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(22) දුරකථන බිල් දීමනාව -

විශේෂඥ වෛද්‍ය නිලධාරි - රු. 8,000.00 (මසකට)
වෛද්‍ය නිලධාරි - රු. 4,000.00 (මසකට)

6. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*- විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

7. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :*

(*අ*) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තර හා පැහැදලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2020 දෙසැම්බර් මස 14 වන දින මධ්‍යහ්න 1200 ට හෝ ඊට පෙර ලැබෙන සේ ''**විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''................................ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල / සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල /සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග **සහතික කරනලද** ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක්. (අධ්‍යාපන ව්‍යාවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය වලංගු නොවේ).

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල්පිටපත් හා එහි ඡායාපිටපත බැගින්.

(4) පිලිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්.

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්.

(7) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(8) අඟල් 2x2 ½ ප්‍රමාණයේ ග්‍රාමනිළධාරී විසින් සහතික කරන ලද වර්ණ ඡායා රූප දෙකක්.

(*ඈ*) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(*ඉ*) වෙනත් කිසිම ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

(ඒ) අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

8. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වේ.

9. *තෝරාගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය :-*

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු / ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට / ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙලඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

එස්. කේ. පතිරණ,
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්), ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕඑ) යූඑස්ඒ, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන)
කළමනාකරණ, එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා), එන්ඩීසී (ඉන්දියා),
පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල් ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති
මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594
කොළඹ

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ ............ශාඛාවේ**
**අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————. (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)
2. සම්පූර්ණ නම ඃ (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ඉල්ලුම් කරන ශාඛාව :————.
5. ඉල්ලුම් කරන තනතුර :————.
6. ස්ථිර ලිපිනය :————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
8. තැපැල් ලිපිනය :————.
9. විද්‍යුත් ලිපිනය :————.
10. උපන් දිනය :————.
    වයස ඃ (2021 ජනවාරි මස 15 වන දිනට) අවුරුදු :————. මාස :————. දින :————.
11. උස ඃ සෙන්ටිමීටර් (අඩි......... අඟල් ...........)
12. දිස්ත්‍රික්කය :————.
13. ඡන්ද කොට්ඨාසය :————.
14. ග්‍රාම නිළධාරී කොට්ඨාසය සහ අංකය :————.
15. දුරකථන අංක :————.
16. විවාහක හෝ අවිවාහක බව :————.
17. අධ්‍යාපනය ලැබූ පාසල :————.
18. පාසැල් සහ/ හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ඃ

| පාසැලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| පාසැලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (උ.පෙළ) (විශ්ව විද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම් | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :

20. පාසැලෙන් /විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දැනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා : | | | | |
| මව : | | | | |

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර :- (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න) :————.

23. පාසැලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමඟ විස්තර දක්වන්න.) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

25. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම්කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම් වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :-

පූර්වෝක්ත ප්‍රශ්න වලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථාද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

30. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළයුතු ප්‍රකාශය :

(අ) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාමේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ........................................................................................ නැමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාල නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

11-396

## ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාලව ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

වෘත්තීය සහ අදාළ අධ්‍යාපන සුදුසුකම් ඃ

2. සිවිල් ඉංජිනේරු වෘත්තීන් සඳහා අටවන (08) ශ්‍රේණිය සමත්වීම සහ වෘත්තීන් සඳහා අවශ්‍ය වෘත්තීය සුදුසුකම් පහත සඳහන් වේ ඃ-

සිවිල් ඉංජිනේරු වෘත්තීන් - පිරිමි-

(අ) කම්හල් සහ පැස්සුම් ශිල්පී
(ආ) ඉදිකිරීම් කාර්මික ශිල්පී
(ඇ) ජලනල කාර්මික ශිල්පී
(ඈ) දැව කාර්මික ශිල්පී
(ඉ) විදුලි කාර්මික ශිල්පී
(ඊ) වායු සමීකරණ සහ ශීතකරණ කාර්මික ශිල්පී

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන හෝ අර්ධකාලීන ඉහත වෘත්තීන්ට අදාළ පාඨමාලාවක් හදාරා ඊට අදාළ සහතික (NVQ III) ලබා තිබීම අමතර සුදුසුකමක් වන අතර අවම වශයෙන් වෘත්තිය පිළිබඳ වසර දෙකක (02) සේවා පලපුරුද්ද පිළිබඳ සනාථ කිරීම.

සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීය - රථ වාහන ක්‍රියාකරු (පිරිමි)

සිංහල / දෙමළ සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා, පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. සැහැල්ලු රියදුරු බලපත්‍රය අනිවාර්ය වේ. (බරවාහන බලපත්‍රය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ). වසර 02ක් හෝ ඊට වැඩි සේවා පළපුරුද්ද ඇති අයවලුන් සහ බරවාහන හෝ විශේෂ වාහන බලපත්‍ර හිමි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සහතිකයක් හෝ ඒ හා සමාන පාඨමාලාවක් හදාරා එම වාහන පිළිබඳ පිළිගත් ආයතනයක වසර 02ක් හෝ ඊට වැඩි සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**ඉඳුරාම බඳවා ගැනීම ස්වේච්ඡා- සිවිල් ඉංජිනේරු වෘත්තීන්**

(අ) සැලසුම් ශිල්පී -පිරිමි/කාන්තා

සිංහල / දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස, (සා,පෙළ)විභාගය සමත්ව තිබිය යුතුය.

ජාතික තාක්‍ෂණික සහතිකය ඉංජිනේරු සැලසුම් ශිල්පී (National Engineering Draughtsmanship) පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාව සමත්ව තිබීම සහ වෘත්තියේ වසර දෙකක (02) සේවා පලපුරුද්ද පිළිබඳ සනාථ කිරීම. (වෘත්තීය සුදුසුකම් මත නායක ගුවන්භට නිලයට හෝ කෝප්‍රල් නිලයට බඳවා ගනු ලැබේ)

(ආ) වැඩ මූලික (සිවිල්/විදුලි/යාන්ත්‍රික) - (පිරිමි)

සිංහල / දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

ජාතික තාක්‍ෂණික සහතිකය NCT (Civil/Electrical/Mechanical Engineering) අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව හෝ රජයේ වෙනත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඊට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක් සමත්ව තිබීම සහ වෘත්තියේ වසර දෙකක (02) සේවා පලපුරුද්ද පිළිබඳ සනාථ කිරීම. (වෘත්තීය සුදුසුකම් මත නායක ගුවන්භට නිලයට හෝ කෝප්‍රල් නිලයට බඳවා ගනු ලැබේ).

වෛද්‍ය වෘත්තීන් ඉඳුරාම බඳවා ගැනීම ස්වේච්ඡා - රසායනාගාර කාර්මික ශිල්පී (පිරිමි/කාන්තා)

සිංහල / දෙමළ ගණිතය විද්‍යාව සහ වෙනත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

රසායනාගාර කාර්මික ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කර (Bsc *or* Diploma Holders) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුයි. අවුරුදු 02කට නොවැඩි සේවා පළපුරුද්ද තිබිය යුතුය. (වෘත්තීය සුදුසුකම් මත නායක ගුවන්භට නිලයට හෝ කෝප්‍රල් නිලයට බඳවා ගනු ලැබේ).

3. *අනෙකුත් සුදුසුකම්* :

(අ) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුය.

(1). පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය

(2). සිවිල් තත්ත්වය : ස්වේච්ඡා බඳවා ගැනීම - විවාහක/ අවිවාහක

(3). වයස : 2021 ජනවාරි මස 15 වැනි දිනට

ස්වේච්ඡා පිරිමි - අවුරුදු 18ත් 28ත් අතර
ස්වේච්ඡා කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර

(4). උස : අඩි 5 අඟල් 4 ට : 162.6 cm නොඅඩු විය යුතුයි. (පිරිමි)
සිවිල් ඉංජිනේරු වෘත්තිකයන් සඳහා පමණි.
අඩි 5 අඟල් 5 ට : 165 cm - නොඅඩු විය යුතුයි. (පිරිමි)
අඩි 5 අඟල් 3 ට : 160 cm - නොඅඩු විය යුතුයි. (කාන්තා)

(5). බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය > 26 (පිරිමි) (ශරීර ස්කන්ධ දර්ශකය) $\frac{\text{බර (කි.ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$
17 < ශරීර ස්කන්ධ දර්ශකය > 25 (කාන්තා)

(6). වර්ණ දෘෂ්ටිය : සීපී2 ($CP_2$)

(7). දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත)

(8). පපුව : අඟල් 30 ට නොඅඩු විය යුතුය (පිරිමි)
සිවිල් ඉංජිනේරු වෘත්තිකයන් සඳහා පමණි.
අඟල් 32 ට නොඅඩු විය යුතුය (පිරිමි)

4. දෙවන, ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ තුන්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගනු නොලබන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ සඳහන් කර ඇති පරිදි උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

5. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

6. *සේවා කොන්දේසි* :

අ. අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව ස්වේච්ඡා සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති වෘත්තීය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව නිමවීමෙන් පසු ඔහු වෘත්තිය ගුවන්භටයෙකු ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

ආ. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපතිතුමා විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

ඇ. පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

ඈ. සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

ඉ. පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින්හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

ඊ. පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකුහට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනිමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුදා සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

ඌ. මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

එ. පළමුවන ඡේදයේ සිට තුන්වන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

ඒ. අවිවාහක ගුවන් භටයින් නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්හට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

ඔ. විවාහක ගුවන් භටයින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

ඕ. සියලුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් රාජකාරී හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

ක. සියලුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

7. බඳවා ගැනීමේ කොන්දේසි :

අ. ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා -සිවිල් ඉංජිනේරු වෘත්තිකයන්

(1). තෝරා ගනු ලබන අපේක්ෂකයින් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන්හට නිළයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 02 ක සේවා කාලයකට යටත් විය යුතුය. අවුරුදු 02ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට අවස්ථාව ලබාදෙනු ඇත.

ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා - වෛද්‍ය සහ ප්‍රවාහන ක්‍රියාකරු වෘත්තිකයන්

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයින් ස්වේච්ඡා ගුවන් හමුදාවේ වෘත්තීය නිපුනතාවය මත අදාළ නිළයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 05 ක සේවා කාලයකට යටත් විය යුතුය. අවුරුදු 05 ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

8. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්*.- තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

9. *වැටුප් හා දීමනා* :

(අ) නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් භටයින්ට අදාල මූලික වැටුප සහ දීමනා පරිමාණ පහත සඳහන් පරිදි වේ. :-

| *නිලය* | *මූලික වැටුප රු.* | *අනෙකුත් දීමනා රු.* | *අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප රු.* |
|---|---|---|---|
| ගුවන්භට | 29,540.00 | 12,150.00 | 41,690.00 |
| නායක ගුවන්භට | 30,440.00 | 12,150.00 | 42,590.00 |
| කෝප්‍රල් | 31,340.00 | 12,150.00 | 43,490.00 |

10. ඉල්ලුම්කරුට / ඉල්ලුම්කාරියට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2020 දෙසැම්බර් මස 14 වන දින දහවල් 1200ට පෙර ලැබෙනසේ **විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරී, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් භාරගනු නොලැබේ), අයදුම්පතේ ඉහල වම් කෙලවරේ **ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්වේච්ඡා ගුවන් භටයින් සඳහා ඉල්ලුම්පත** යනුවෙන් සඳහන් කළයුතුය. එක් අයඳුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කලයුතු අතර වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයඳුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනාවූද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නාවූද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රජයේ සේවයේ / සංස්ථා / මණ්ඩල / සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල / සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. තවද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමඟ තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙනවිට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත; (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) ජාතික හැඳුනුම්පත සහ ඡායා පිටපත;

(3) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික;

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;.

(5) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි

වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(7) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්

(8) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අඟල් 2 x 2 1/2 වර්ණ ඡායා රූපයක්.

(ඇ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නො එවිය යුතුය.

(ඊ) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

12. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සේවයට බඳවා ගනු නොලැබේ.

13. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු වල අගය අනුව අපේක්ෂකයන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

14. අයදුම්කරුවෙක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහි ලා බලපෑම් කිරීමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

15. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

16. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

එස්. කේ. පතිරණ,
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්), ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕඑ) යූඑස්ඒ, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන)
කළමනාකරණ, එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා), එන්ඩීසී (ඉන්දියා),
පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල් ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594
කොළඹ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ .............................. වෘත්තීය සඳහා
ගුවන් භට / ගුවන් කාන්තා අයදුම්පත

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. තැපැල් ලිපිනය :————.

6. උපන් දිනය :————.
වයස : (2021 ජනවාරි මස 15 වන දිනට) අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : සෙන්ටිමීටර් :————. (අඩි......... අඟල් ...........)

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

9. දිස්ත්‍රික්කය :————.

10. ඡන්ද කොට්ඨාසය :————.

11. ග්‍රාම නිළධාරී කොට්ඨාසය :————.

12. දුරකථන අංකය :————.

13. විවාහක හෝ අවිවාහක බව :————.

14. ස්ත්‍රී පුරුෂ භාවය :————.

15. අධ්‍යාපනය ලැබූ පාසල :————.

16. පාසැල් පිළිබඳ විස්තර :

| පාසැලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ)<br><br>අ. පො. ස. (උ. පෙළ)<br><br>වෙනත් | | |

17 පාසැලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ෑ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර ෑ

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා ෑ<br><br>මව ෑ | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න) :————.

21. පාසැලේ දී හෝ බාහිර සංවිධාන වලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලීම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක් දැයි සඳහන් කරන්න :————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇග බැඳ තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක / සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර ෑ

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ෑ

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථාද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

28. ඉල්ලුම්කරුගේ මව / පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ

(අ) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ...................................................................................... නැමැති අපේක්ෂකයාගේ මව / පියා / භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම / ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු / ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය / භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :————————————————————————.

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————————————————————————.
————————————————————————.

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————————————————————————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————————————————————————.
————————————————————————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————————————————————————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————————————————————————.
————————————————————————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

11-397

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

02. සේවා කොන්දේසි :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගතවීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන්හි සඳහන් පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ මට්ටම අනුව තනතුරට බැඳි වසර 05 ක් ඇතුළත නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. *වැටුප*.-අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 2-2016) රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු.47,990 (ආරම්භක වැටුප - රු.28,940) ක් වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම්* :

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.-

(I) ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී ගණිතය ඇතුළු විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලසු ලේඛනය සහ යතුරු ලියනය පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම.

සැ.යු. - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2020 නොවැම්බර් මස 27 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *විභාග පටිපාටිය* :-
විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය | මුළු ලකුණු | සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|
| 01 භාෂා හැකියාව | 100 | 40 |
| 02 අභියෝග්‍යතාවය | 100 | 40 |
| 03 ලඝු ලේඛනය හා යතුරු ලියනය | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ලඝු ලේඛනය හා යතුරු ලියන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

ලඝු ලේඛනය හා යතුරු ලියනය ප්‍රශ්න පත්‍රය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පිළිතුරු සැපයිය යුතුය.රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 03 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි) | ලඝු ලේඛනය (ඉංග්‍රීසි)<br>විනාඩියකට වචන 80 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 08 ක වේගයෙන් පිටපත් කිරීම.<br>යතුරු ලියනය (ඉංග්‍රීසි)<br>දෙනු ලබන වචන 600 ක ඡේදයක් විනාඩියකට වචන 30 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. |

**සටහන** : සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

*විභාග ප්‍රතිඵල*.-අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් තැපැලෙන් සිදු කරනු ඇත.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකළ බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. *විභාග ගාස්තු* .- විභාග ගාස්තු රු. 400 කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2 " x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(ආ) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2021 ජනවාරි මස 15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020**" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. 2021 ජනවාරි මස 15 පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(ඈ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චය-කාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. *විභාගයට පෙනී සිටීම.*- ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මඟින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

13. *විභාගයට ඇතුළත් වීම* :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය

පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන -අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමග නම :————.
මයා/මිය/මෙය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : A. P. K. SIRIWARDANA

2.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.5 පදිංචි දිස්ත්‍රික්කය :————.

2.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.

2.7 ජාතික හැඳුනුම්පත් අංකය :

2.8 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

2.9 2020.11.27 දිනට වයස ඃ

අවුරුදු ඃ ☐☐ මාස ඃ ☐☐ දින: ☐☐

2.10 ස්ත්‍රී/පුරුෂ භාවය ඃ පුරුෂ - 1 ස්ත්‍රී - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව ඃ විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 දුරකථන අංකය ඃ
ස්ථාවර :————. ජංගම :————. ෆැක්ස් :————.

03. අධ්‍යාපන සුදුසුකම්:

3.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(1) විභාගයේ වර්ෂය හා මාසය :————.

(2) විභාග අංකය :————.

(3) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

3.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(1) විභාගයේ වර්ෂය හා මාසය :————.

(2) විභාග අංකය :————.

(3) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

04. හදාරා ඇති පාඨමාලාව :————.
(පාඨමාලාව සමත් සහතිකය අමුණන්න)

05. වෙනත් සුදුසුකම් ඃ ..........................................................................................
..........................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐ ..........................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
ලදුපත් අංකය හා දිනය :————.
ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |
|---|

08. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී...................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය :————.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2020.11.27 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

නිල මුද්‍රාව :————.

11-444

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

### ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන

### පාඨමාලා සඳහා බඳවා ගැනීම - 2021

<table>
<tr><th>අංකය</th><th>පූර්ණ කාලීන පාඨමාලා</th><th>NVQ මට්ටම</th><th>කාලය (මාස)</th><th>අධ්‍යාපන සුදුසුකම්</th><th>අපෙන් ඔබට . . . .</th></tr>
<tr><td>01</td><td>යන්ත්‍රන ශිල්පී පාඨමාලා</td><td>NVQ 04</td><td>12</td><td rowspan="3">අ.පො.ස. (සා/පෙළ) විෂයන් 06කින් සමත්වීම</td><td rowspan="16">• NVQ මගින් තාක්ෂණ උපාධිය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථාව<br>• ස්වයං රැකියා සඳහා රු. 500,000.00 දක්වා ණය පහසුකම්<br>• දෙස් විදෙස් රැකියා අවස්ථා<br>• වෘත්තීය උපදේශන සේවා<br>• වෘත්තීය ඉංග්‍රීසි දැනුම/ශිල්පීය ප්‍රවර්ධන දැනුම<br>• ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන<br>• නායකත්ව පුහුණු/පෞරුෂ වර්ධන වැඩසටහන්<br>• තෝරාගත් පාඨමාලා සඳහා ආධුනික දීමනා<br>• ප්‍රවාහන පහසුකම්<br><br>දැනටමත් ක්ෂේත්‍රයේ නියුතු ඔබට අපෙන් RPL මගින් NVQ සහතිකයක්<br><br><u>පාඨමාලා සඳහා යොමුවිය යුතු ආකාරය</u><br>ඔබ විසින් සකස් කරගත් අයදුම්පතක් (නම, ලිපිනය, දුරකථන අංකය, කැමති පාඨමාලාව (පූර්ණ කාලීන/අර්ධ කාලීන) අධ්‍යාපන සුදුසුකම් ඇතුළත්ව) 2020.12.20 දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.<br><br><u>අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය</u><br><br>සහකාර අධ්‍යක්ෂ,<br>ජාතික වෘත්තීය පුහුණු ආයතනය,<br>අංක 100, කඳවල පර,<br>රත්මලාන<br>විමසීම්<br>0112638850/0710318736/0710991707<br>ඊමේල් <u>nvtirathmalana@vtasl.gov.lk</u></td></tr>
<tr><td>02</td><td>විදුලි කාර්මික ශිල්පී (කර්මාන්ත)</td><td>NVQ 04</td><td>12</td></tr>
<tr><td>03</td><td>ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී</td><td>NVQ 04</td><td>12</td></tr>
<tr><td>04</td><td>සැලසුම් ශිල්පී</td><td>NVQ 04</td><td>12</td><td rowspan="3"></td></tr>
<tr><td>05</td><td>ග්‍රැෆික් නිර්මාණ ශිල්පී</td><td>NVQ 04</td><td>06</td></tr>
<tr><td>06</td><td>පරිගණක දෘඩාංග ශිල්පී</td><td>NVQ 04</td><td>06</td></tr>
<tr><td>07</td><td>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී</td><td>NVQ 04</td><td>06</td><td>ගණිතය, ඉංග්‍රීසි සම්මාන සහිතව අ.පො.ස. (සා/පෙළ) විෂයන් 06කින් සමත්වීම</td></tr>
<tr><td>08</td><td>ඉලෙක්ට්‍රොනික් තාක්ෂණ ශිල්පී</td><td>NVQ 04</td><td>12</td><td rowspan="2">ගණිතය, විද්‍යාව ඇතුළුව අ.පො.ස. (සා/පෙළ) විෂයන් 06කින් සමත්වීම</td></tr>
<tr><td>09</td><td>වායුපීඩන තාක්ෂණ ශිල්පී</td><td>NVQ 04</td><td>12</td></tr>
<tr><td>10</td><td>ඉදිකිරීම් ශිල්පී</td><td>NVQ 04</td><td>12</td><td>09 වසර සමත්වීම</td></tr>
<tr><td>11</td><td>මෝටර් රථ කාර්මික ශිල්පී</td><td>NVQ 04</td><td>18</td><td>අ.පො.ස.(සා/පෙළ) විෂයන් 06කින් සමත්වීම</td></tr>
<tr><td>12</td><td>ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී</td><td>NVQ 04</td><td>06</td><td>අ.පො.ස. (සා/පෙළ) පෙනී සිටීම</td></tr>
<tr><td>13</td><td>උද්‍යාන අලංකරණ ශිල්පී</td><td>NVQ 04</td><td>06</td><td>09 වසර සමත්වීම</td></tr>
<tr><td>14</td><td>පැස්සුම් ශිල්පී</td><td>NVQ 04</td><td>12</td><td>අ.පො.ස. (සා/පෙළ) විෂයන් 03කින් සමත්වීම</td></tr>
<tr><td>15</td><td>සහකාර ප්‍රමාණ සමීක්ෂණ</td><td>NVQ 04</td><td>06</td><td>අ.පො.ස. (උ/පෙළ) විෂයන් 02කින් සමත්වීම</td></tr>
<tr><td>16</td><td>ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව</td><td>NVQ 05</td><td>12</td><td>ගණිතය/විද්‍යා/තාක්ෂණවේදය අංශයෙන් අ.පො.ස.(උ/පෙළ) විෂයන් 03කින් සමත්වීම හෝ NVQ 04 සහතිකය ලබා තිබීම</td></tr>
</table>

➢ සියලු පාඨමාලා නොමිලේ පැවැත් වේ.

➢ නව පාඨමාලා 2021 ජනවාරි මස 04 වැනි දින ආරම්භ කෙරේ.

11-446

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.